# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## Police Media Division

තැ.පෙ. අංකය / த.பெ.இ / P.O. Box No — 517

ෆැක්ස් / தொலை நகல் / Fax — 011-2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

වෙබ් ලිපිනය / இணைய தளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E mail — dir.media@police.lk


මගේ අංකය / எனது இல / My No — 706 / 2022

ඔබේ අංකය / உமது இல / Your No —

දිනය / திகதி / Date — 2022.05.10 පැය 1150

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**2022.05.09 වන දින අරලියගහ මන්දිරයට පැමිණි පිරිසක් පසුව ප්‍රචණ්ඩකාරිව හැසිරීම සම්බන්ධව විමර්ශන ආරම්භ කිරීම.**

2022.05.09 වන දින පෙරවරුවේ හිටපු අග්‍රමාත්‍යතුමාට සහාය පළ කිරීම සඳහා අරලියගහ මන්දිරයට පැමිණි පිරිසක් පසුව එම මන්දිරය ඉදිරිපිට කූඩාරම් තුළ රැඳී සිටි විරෝධතාකරුවන් වෙත ගොස් ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙමින් එම ස්ථානයේ තිබූ දේපළ වලට හානි කොට රැදි සිටි පිරිසට පහරදී අනතුරුව පොලිස් අණ නොතකා ගාලුමුවදොර ජනාධිපති කාර්යාලය අසල රැදි සිටි විරෝධතාකරුවන් අසලට ද ගොස් එහි දේපළ වලටද හානිකොට එම පිරිසට පහරදීමේ සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා වී තිබුණි.

එම සිදුවීමට අදාළව කඩිනමින් විමර්ශන ආරම්භ කර අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙසට පොලිස්පති විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත අද දින නියෝග කරන ලදී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**